# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1834/27 - 2013 ඔක්තෝබර් මස 30 වැනි බදාදා - 2013.10.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### බස්නාහිර පළාතේ පළාත් සභාව

1992 අංක 01 දරන බස්නාහිර පළාතේ මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරී ප්‍රඥප්තියේ 7 (1) (2) සහ 30 (1) (2)
1993 අංක 03 දරන බස්නාහිර පළාතේ මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා (සංශෝධන)
ප්‍රඥප්තියේ 5 - 6 වගන්තිය යටතේ වූ රීති

බස්නාහිර පළාත් සභාවේ 2002 වර්ෂයේ අංක 06 දරන මාර්ගස්ථ මගී ප්‍රවාහන ත්‍රීරෝද රථ සේවා ප්‍රඥප්තිය සහ 2007 අංක 03 දරන බස්නාහිර පළාතේ මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා (සංශෝධන) ප්‍රඥප්තියේ 30 වගන්තිය යටතේ වූ රීති මෙයින් අවලංගු කරනු ලැබේ.

1992 අංක 01 දරන බස්නාහිර පළාතේ මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා ප්‍රඥප්තියේ 7 (1) (2) සහ 30 (1) (2) 1993, අංක 03 දරන බස්නාහිර පළාතේ මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා (සංශෝධන) ප්‍රඥප්තියේ 5 - 6 වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව බස්නාහිර පළාත තුළ මගී ප්‍රවාහනයේ යොදවනු ලබන ත්‍රීරෝද රථ හා කුලී රථ සම්බන්ධයෙන් සාදනු ලැබ අත්තාවූ රීති පහත පරිදි බව මෙයින් නිවේදනය කරමි.

එච්. එම්. උපාලි කොඩිකාර,
ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු,
සමූපකාර සංවර්ධන, ආහාර සැපයීම් හා බෙදා හැරීම් සහ
ග්‍රාම සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍ය.

වර්ෂ 2013 ඔක්තෝබර් මස 10 වැනි දින දී ය.

1A - PG 001813 — 160 (2013/10)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1. මෙම රීති "ත්‍රීරෝද රථ හා කුලී රථ මගින් මගීන්, ප්‍රවාහනය කිරීම සම්බන්ධයෙන් රීති" යනුවෙන් හඳුන්වනු ලබන අතර එකී රීති 2013 ඔක්තෝබර් මස 10 දින සිට බස්නාහිර පළාත තුළ ක්‍රියාත්මක වන්නේය.

2. ත්‍රීරෝද රථ හා කුලී රථ බස්නාහිර පළාතේ මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා ප්‍රඥප්තියේ විධිවිධාන ප්‍රකාරව බලයලත් වාහනයක් වන අතර මතු දැක්වෙන රීතිවලට අමතරව ත්‍රීරෝද රථ හා කුලී රථ සම්බන්ධයෙන් බස්නාහිර පළාතේ මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා ප්‍රඥප්තියේ සහ එකී ප්‍රඥප්තියට සිදු කර ඇති සංශෝධන ද ඒ යටතේ සාදා ඇති රෙගුලාසි සහ නියෝග ද ත්‍රීරෝද රථ හා කුලී රථ වලට අදාළ වන්නා වූ පරිදි අදාළ වෙනස් කිරීම්වලට යටත්ව ත්‍රීරෝද රථ හා කුලී රථ සම්බන්ධයෙන් ද බලපවත්වන්නේය.

3. බස්නාහිර පළාත තුළ නිතිපතා මගී ප්‍රවාහන සේවයේ යෙදෙන සෑම ත්‍රීරෝද රථ හා කුලී රථයක්ම මින්මතුවට අධිකාරිය ලෙසින් හඳුන්වනු ලබන බස්නාහිර පළාතේ මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ නිසි පරිදි ලියාපදිංචි කර තිබිය යුතු වේ.

4. අධිකාරිය විසින් නිකුත් කරන ලද්දා වූ ද, තත්කාලයේ වලංගුව පවතින්නා වූ ද නිත්‍ය මගී ප්‍රවාහන සේවා අවසර පත්‍රයක හෝ මගී ප්‍රවහනය කිරීම පිණිස වෙනත් අධිකාරියක බලය යටතේ නිකුත් කරනු ලබන අවසර පත්‍රයක බලය මත හැර කිසිම තැනැත්තෙකු විසින් ගාස්තුවක් ප්‍රතිලාභයක් මත නිතිපතා මගී ප්‍රවාහනය කිරීම සඳහා කිසිදු ත්‍රීරෝද රථ හා කුලී රථ බස්නාහිර පළාත තුළ පාවිච්චි නොකළ යුතු වන්නේය.

5. ගාස්තු හෝ ප්‍රතිලාභයක් මත මගී ප්‍රවාහනය කිරීම සඳහා අවසර පත්‍රයක් හෝ එවැනි වෙනත් අධිකාරියක් ලැබ ඇත්තාවූ සෑම ත්‍රීරෝද රථයක් හා කුලී රථයක්ම එකී නිත්‍ය මගී ප්‍රවාහන සේවා අවසර පත්‍රයේ හෝ වෙනත් එවැනි අධිකාරියක පිටපතක් ත්‍රීරෝද රථ හා කුලී රථයේ වාමුවා වීදුරුවේ ප්‍රදර්ශනය කළ යුතුය.

6. අධිකාරිය විසින් නිකුත් කරන ලද්දාවූ මගී ප්‍රවාහන සේවා අවසර පත්‍රයක බලය යටතේ ධාවනය කරනු ලබන සෑම ත්‍රීරෝද රථ හා කුලී රථ ම ඉදිරිපස දකුණු බඳෙහි අධිකාරිය විසින් නිකුත් කරනු ලබන මගී ප්‍රවහන සේවා අවසර පත්‍ර ලේබලය ප්‍රදර්ශනය කළ යුතු වේ.

7. ත්‍රීරෝද රථ හා කුලී රථ ලියාපදිංචිය සඳහා අධිකාරිය වෙත අයදුම්පත් ඉදිරිපත් කිරීමේ දී අධිකාරිය ලවා වාහනයේ තත්ත්ව පාලන වාර්තාවක් ලබාගත යුතුය. වාහනයේ ධාවන තත්ත්වය පිළිබඳව සෑහීමට පත්විය හැකි නම් පමණක් තත්ත්ව පාලන වාර්තාව නිකුත් කරනු ඇත.

8. යම් කිසි සමාගමක් විසින් ත්‍රීරෝද රථ හා කුලී රථ සේවාවක් පවත්වාගෙන වන අවස්ථාවක දී එම සමාගම මගී ප්‍රවාහනය සඳහා බලපත්‍රයක් ලබා ගැනීම සඳහා අයදුම්පත් ඉදිරිපත් කිරීමේ දී තම සමාගමේ ලියාපදිංචිය සහතිකය ඉදිරිපත් කළ යුතුය.

9. සමාගම විසින් මගී ප්‍රවාහන සඳහා භාවිතා කරනුයේ එම සමාගමේ නොවන වාහන නම් එම වාහන වල අයිතිකරු විසින් ඒවා මගී ප්‍රවාහන සඳහා සමාගමට පැවරූ බවට නිත්‍යානුකූල ලේඛන ඉදිරිපත් කළ යුතුය.

10. බස්නාහිර පළාත තුළ නිත්‍ය මගී ප්‍රවාහන සේවාවක් පවත්වාගෙන යාම සඳහා මගීන් ප්‍රවාහන කිරීමට යොදවනු ලබන ත්‍රීරෝද රථ හා කුලී රථයේ අයිතිකරු විසින් අධිකාරිය විසින් නියම කරනු ලබන ආකෘතියක් යටතේ ඉල්ලුම් පත්‍රයක් අධිකාරිය වෙත ඉදිරිපත් කළ යුතු වේ.

11. ත්‍රීරෝද රථයක් හා කුලී රථයක් මගින් මගීන් ප්‍රවාහන කිරීම සම්බන්ධයෙන් අධිකාරිය වෙත ඉදිරිපත් කරනු ලබන සෑම අයදුම්පත්‍රයක් සමගම එකී අයදුම්පත්‍රයේ ඉල්ලා ඇති විස්තරවලට අමතරව මගී ආරක්ෂාව සහ සුව පහසුව සම්බන්ධයෙන් අධිකාරිය විසින් ඉදිරිපත් කිරීමට නියම කරනු ලබන්නාවූ වෙනත් විස්තර සහ ලේඛන ද ඉල්ලුම්කරු විසින් ඉදිරිපත් කළ යුතු වේ.

12. ත්‍රීරෝද රථ හා කුලී රථ ලියාපදිංචි අයිතිකරු හෝ අංක (8) යටතේ දැක්වෙන සමාගමක් නොවන තැනැත්තෙකුට නිත්‍ය මගී ප්‍රවාහන සේවාවක් පවත්වාගෙන යාම සඳහා මගී ප්‍රවාහන සේවා අවසර පත්‍රයක් නිකුත් නොකළ යුත්තේය.

13. එක ම ත්‍රීරෝද රථයක් හා කුලී රථයක් සඳහා මගී ප්‍රවාහන සේවා අවසර පත්‍ර එකකට වඩා නිකුත් නොකළ යුත්තේය.

14. අවසර පත්‍රයක් සම්බන්ධයෙන් ඉල්ලුම් කිරීමේදී ඉදිරිපත් කරන ලද විස්තරවලට යම් කිසි වෙනසක් සිදු වේ නම්, එකී වෙනස් වීම් සිදු වූ දිනයේ සිට දින 14ක් ඇතුළත අධිකාරිය වෙත දැනුම් දිය යුතු වන්නේය.

15. මගී ප්‍රවාහන සේවාවක් පවත්වාගෙන යාම සඳහා යම්කිසි ත්‍රීරෝද රථ හා කුලී රථයකට ලබා දී ඇති නිත්‍ය මගී ප්‍රවාහන සේවා අවසර පත්‍රයක් අධිකාරියේ පූර්ණ ලිඛිත අනුමැතියකින් තොර ව අන්සතු කිරීම හෝ වෙනස් ආකාරයකින් පැවරීම නොකළ යුත්තේය. එවැනි පැවරුම් බල රහිත හා ශුන්‍ය එකක් වන්නේය.

16. ත්‍රීරෝද රථ හා කුලී රථ සඳහා නිකුත් කර ඇති නිත්‍ය මඟී ප්‍රවාහන සේවා අවසර පත්‍රයක් එකී අවසර පත්‍රය කලින් අවලංගු කළ හොත් මිස නිකුත් කරන ලද දිනයේ සිට මාස 12 ක කාලයක් සඳහා වලංගු වන්නේය.

17. මඟී ප්‍රවාහනය සඳහා ත්‍රීරෝද රථයක් හා කුලී රථයක් වෙත නිකුත් කරනු ලබන නිත්‍ය මඟී ප්‍රවාහන සේවා අවසර පත්‍රයක් නොවන වෙනත් අධිකාරිය වලංගු කාලය එකී අධිකාරියක නිශ්චිතව දක්වා ඇති කාලයට පමණක් සීමා වන්නේය.

18. මඟීන් ප්‍රවාහනය කරන ත්‍රීරෝද රථ හා කුලී රථ සම්බන්ධයෙන් අදාළ වන්නාවූ ගාස්තු පහත පළමුවැනි උපලේඛනයේ දක්වා ඇති අතර, එකී ගාස්තු අවසර පත්‍ර ඉල්ලුම්කරු විසින් හෝ අවසර පත්‍රධාරියා විසින් අධිකාරිය වෙත ගෙවිය යුතු වන්නේය.

19. නිත්‍ය මඟී ප්‍රවාහන සේවා අවසර පත්‍රධාරියා සහ ත්‍රීරෝද රථයකින් හා කුලී රථයකින් මඟීන් ප්‍රවාහනය කිරීමට වෙනත් අධිකාරයක් ලබා ඇත්තාවූ සෑම තැනැත්තෙකුම එකී නිත්‍ය මඟී ප්‍රවාහන සේවා අවසර පත්‍රයේ හෝ වෙනත් එවැනි අධිකාරියක දක්වා ඇති කොන්දේසි පිළිපැදිය යුතු වන්නේය.

20. අධිකාරිය විසින් නිකුත් කරනු ලබන නිත්‍ය මඟී ප්‍රවාහන සේවා අවසර පත්‍රයක හෝ වෙනත් අධිකාරියක් යටතේ මඟී ප්‍රවාහනයේ යොදවනු ලබන සෑම ත්‍රීරෝද රථයක්ම හා කුලී රථයක් ම රියදුරා අධිකාරියේ ලියාපදිංචි විය යුතුය.

21. කිසිදු මඟී ප්‍රවාහන අවසර පත්‍රලාභියෙකු විසින් අධිකාරියේ ලියාපදිංචි නොකරන ලද රියදුරකු ලවා අවසරපත්‍ර ලාභී ත්‍රීරෝද රථයේ හා කුලී රථයේ මඟීන් ප්‍රවාහනය කිරීම නොකල යුතුය.

22. අධිකාරිය විසින් නිකුත් කරනු ලබන නිත්‍ය මඟී ප්‍රවාහන සේවා අවසර පත්‍රයක හෝ වෙනත් අධිකාරයක් යටතේ මඟී ප්‍රවාහනයේ යොදවනු ලබන සෑම ත්‍රීරෝද රථයක්ම හා කුලී රථයක ම රියදුරෙකු අධිකාරිය විසින් නිකුත් කරනු ලබන හැඳුනුම්පත ත්‍රීරෝද රථය හා කුලී රථය ධාවනය කරනු ලබන සෑම අවස්ථාවක ම ලග තබා ගත යුතු අතර එම හැඳුනුම්පතේ සඳහන් සියලු තොරතුරු ත්‍රීරෝද රථය හා කුලී රථය පෙනෙන ලෙස පැහැදිලිව ප්‍රදර්ශනය කර තිබිය යුතුය.

23. අධිකාරිය විසින් නිකුත් කර ඇත්තාවූ නිත්‍ය මඟී ප්‍රවාහන සේවා අවසර පත්‍රයක් යටතේ මඟීන් ප්‍රවාහනය කරනු ලබන ත්‍රීරෝද රථයක් හා කුලී රථයක් ම ගාස්තු මීටර සවි කළ යුතු අතර එකී ගාස්තු මීටර සම්බන්ධයෙන් අධිකාරිය විසින් කලින් කලට පත්වනු ලබන නියෝග අවසර පත්‍රධාරීන් විසින් පිළිපැදිය යුතු වන්නේය.

24. ත්‍රීරෝද රථයේ හා කුලී රථයේ සවි කර ඇත්තාවූ ශබ්ද ජනක යන්ත්‍රවලින් උත්පාදනය කරන්නා වූ ශබ්ද මට්ටම අධිකාරිය විසින් නියම කරනු ලබන ශබ්ද මට්ටම නොඉක්මවිය යුතුය.

25. බලපත්‍රලාභී සෑම ත්‍රීරෝද රථ හා කුලී රථ රියදුරෙකු ම ධාවනයේ දී අධිකාරියේ බලයලත් නිලධාරීන් විසින් දෙනු ලබන සංඥා සහ උපදෙස්වලට අවනත විය යුතුය.

26. අධිකාරිය විසින් නිකුත් කර ඇත්තා වූ නිත්‍ය මඟී ප්‍රවාහන සේවා අවසර පත්‍රයක් යටතේ මඟීන් ප්‍රවාහනය කරනු ලබන සෑම ත්‍රීරෝද රථ හා කුලී රථයකම එකී ත්‍රීරෝද රථයේ හා කුලී රථයේ මඟීන් ප්‍රවාහනය කිරීමේදී අය කරනු ලබන ගාස්තු සම්බන්ධයෙන් ගාස්තු චක්‍රයක් මගින්ට පෙනෙන පරිදි ත්‍රීරෝද රථ හා කුලී රථ තුළ පැහැදිලිව ප්‍රදර්ශනය කර තිබිය යුතුය.

27. ත්‍රීරෝද රථයකින් හා කුලී රථයකින් ගෙනයාහැකි මඟීන් සංඛ්‍යාව අනුමත ප්‍රමාණය නොඉක්මවිය යුතුය.

28. ත්‍රීරෝද රථයකින් හා කුලී රථයකින් මගින් ප්‍රවාහන කිරීම සඳහා අධිකාරිය විසින් නිකුත් කරන ලද නිත්‍ය මඟී ප්‍රවාහන සේවා අවසර පත්‍රයක් හෝ වෙනත් අධිකාරියක යම් තැනැත්තෙකු වෙත නිකුත් කර ඇති බලපත්‍රයක් ද එකී තැනැත්තා බස්නාහිර පළාත් මාර්ගස්ථ මඟී ප්‍රවාහන සේවා ප්‍රඥප්තියේ විධිවිධාන හෝ ඒ යටතේ සාදන ලද නියෝග, රෙගුලාසි සහ රීති අනුව කටයුතු කරන බවට වගබලා ගැනීම පිණිස අවශ්‍ය යැයි පළාත් අධිකාරිය අදහස් කරන විධාන එකී තැනැත්තාට නිකුත් කළ හැකි අතර ඒ විධාන නිකුත් කරන ලද්දේ යම් කිසි තැනැත්තෙකුට ද එකී තැනැත්තකු ඒ විධානවල සඳහන් කාලය ඇතුළත ඒ විධාන අනුව ක්‍රියාකළ යුතුය.

29. ත්‍රීරෝද රථ හා කුලී රථ මඟින් මඟීන් ප්‍රවාහන කිරීමේදී පනවා ඇති රීති කඩ කිරීම වරදක් වන අතර එකී වැරදි සහ වැරදිවලට අය කරනු ලබන දඩ මුදල් පහත දෙවැනි උපලේඛනයේ දක්වා ඇත.

30. සියලුම ත්‍රීරෝද රථ හා කුලී රථ හිමියන් බස්නාහිර පළාත් මාර්ගස්ථ මඟී ප්‍රවාහන අධිකාරිය විසින් අනුමත කරන ලද සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් ක්‍රමයකට දායක විය යුතුය.

**පළමුවැනි උපලේඛනය**

| | | රු. ශත |
|---|---|---|
| 1. | මගී ප්‍රවාහන සේවා අවසර පත්‍රයක් සඳහා ඉල්ලුම්පත්‍ර ගාස්තුව | 100.00 |
| 2. | නිත්‍ය මගී ප්‍රවාහන සේවා අවසර පත්‍ර ගාස්තුව | 250.00 |
| 3. | මගී ප්‍රවාහන සේවා අවසරපත්‍රයක් පැවරීමේ ගාස්තුව | 500.00 |
| 4. | ලේබලය සඳහා | 30.00 |

**ත්‍රීරෝද රථයේ හා කුලී රථයේ තබාගත යුතු ලියවිලි**

1. ආදායම් බදු සහතිකය
2. රක්ෂණ සහතිකය
3. අධිකාරියේ ලියාපදිංචි සහතිකය
4. රියදුරු බලපත්‍රය

**දෙවැනි උපලේඛනය**

| | | රු. ශත |
|---|---|---|
| 1. | වලංගු මගී ප්‍රවාහන සේවා අවසර පත්‍රයක් සන්තයේ තබා ගැනීම පැහැර හැරීම | 100.00 |
| 2. | අවසර පත්‍ර ලේබලය නියමිත පරිදි ප්‍රදර්ශන නොකිරීම | 100.00 |
| 3. | බලයලත් නිලධාරියකු විසින් නියම කරනු ලබන උපදෙස් සහ සංඥා පිළිනොපැදීම | 100.00 |
| 4. | අනුමත ගාස්තු මීටරයක් සවි නොකර ධාවනය කිරීම | 100.00 |
| 5. | අවසරපත්‍ර ලේබලය වාමුවා වීදුරුවේ ප්‍රදර්ශනය නොකිරීම | 100.00 |
| 6. | අධිකාරිය විසින් නිකුත් කරනු ලබන හැඳුනුම්පත රියදුරු විසින් තම සන්තයේ තබා නොගැනීම | 100.00 |
| 7. | ශබ්ද ජනක යන්ත්‍රවලින් උත්පාදන කරන ලබන ශබ්දයක් අනුමත මට්ටම ඉක්මවීම | 100.00 |
| 8. | අධිකාරිය විසින් මගී ප්‍රවේශපත්‍රධාරී වාහනය සම්බන්ධයෙන් ඉල්ලා සිටිනු ලබන ලේඛන වාර්තා විස්තර ඉදිරිපත් කිරීම පැහැර හැරීම | 250.00 |
| 9. | අධිකාරියේ ලියාපදිංචි නොකරන ලද රියදුරෙකු ලවා සිදු කරනු ලබන මගී ප්‍රවාහනය | 2000.00 |

11 - 474

---

## නිවැරදි කිරීමයි

# පළාත් සභා නිවේදන

**බස්නාහිර පළාතේ පළාත් සභාව**

2011 අංක 05 දරන බස්නාහිර පළාතේ වෙළඳ සංස්ථා හා
සංස්ථාගත කරනු නොලැබූ වෙළඳ ආයතනයන් හි ව්‍යාපාර නාම ප්‍රඥප්තිය

අංක 1829/32 දරන 2013 සැප්තැම්බර් මස 25 වැනි දින පළවූ IV (අ) වැනි කොටස - පළාත් සභා නිවේදන, ගැසට් නිවේදනය නිවැරදි කිරීමයි.

ඉහත ශීර්ෂය යටතේ පළ වූ නිවේදනයේ පළමු ජේදයේ පළමුවන පේලියේ "වෛද්‍ය" යන වචනය වැරදි ලෙස මුද්‍රණය වී ඇත. එය "වෙළඳ" යනුවෙන් නිවැරදි විය යුතුය.

ප්‍රසන්න රණතුංග,
බස්නාහිර පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය,
සහ මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන,
පළාත් පාලන හා පළාත් පරිපාලන, විදුලි බල හා බල ශක්ති,
මිනිස්බල හා රැකී රක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ වෙළඳ කටයුතු පිළිබඳ අමාත්‍ය.

11 - 493

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.